# සා.පෙළ සිංහල

# සාම්ප්‍රදායික යෙදුම්

- රූඩී හෙවත් ඉඟි වැකි
- ප්‍රස්තාව පිරුළු
- යුගල පද

**(පසුගිය විභාග ප්‍රශ්නද ඇතුළත් කර ඇත.)**

**( පිළිතුරු සහිතයි )**




**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**


{10 ශ්‍රේණිය - 4 ඒකකය 11 ශ්‍රේණිය - 26 ඒකකය පෙළ පොත ලිඛිත අභ්‍යාස සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි සකස් කර ඇත.}

## සාම්ප්‍රදායික යෙදුම්

- භාෂාව සංස්කෘතික මෙවලමකි. සමාජයක වසන ජනයාගේ ජීවනෝපාය, සිරිත් විරිත්, සිතුම් පැතුම්, ඇදහිලි හා ආකල්ප මත භාෂාව ගොඩනැගේ.
- භාෂාවේ ඇතැම් වචන හා යෙදුම් කාලයක් තිස්සේ ව්‍යවහාර වීම නිසා වාච්‍යාර්ථය ඉක්මවන අමුතු අර්ථ ඒවාට ආරෝපණය වෙයි. ඒවා සාම්ප්‍රදායික යෙදුම් ලෙස සැලකේ.
- සිංහල භාෂාවේ ව්‍යවහාර වන යුගල පද, රූඪී හෙවත් ඉඟි වැකි හා ප්‍රස්තාව පිරුළු මෙබඳු ව්‍යවහාර ය.

## රූඪී හෙවත් ඉඟි වැකි

- යම් යෙදුමකට ඇතුළත් වචනවල අර්ථය ඉක්මවා යන වෙනත් අර්ථයක් ප්‍රකාශ වේ නම් එය **රූඪියක්** ලෙස හැඳින්වේ.
- අර්ථය ඉඟියකින් ගත යුතු නිසා **'ඉඟි වැකි"** ලෙස ද ඒවා හැඳින්වේ. මේවා ඉතා කෙටි යෙදුම් විශේෂයකි. පවසන දෙය ඉතා රසවත්ව හා අවධානය ඇති වන ලෙස කීමටත්, ලිවීමටත් රූඪී නිසා හැකියාව ලැබේ.

## 10, 11 ශ්‍රේණිවල සියලුම රූඪී හෙවත් ඉඟි වැකි

1. කඹ ඇදීම - එකඟතාවක් නැතිකම
2. දෙහි කැපුවා - බැණවැදුණා
3. අත්වැල් බැඳ ගෙන - එකට එක් වී
4. කණකොකා හ'ලා - විනාශය ළං වෙලා
5. කුඩම්මාගේ සැලකිල්ල - වෙනස්කම
6. හය හතර නොදන්නා - දැනුම් තේරුම් නොමැති
7. කරබා ගෙන - නිශ්ශබ්දව
8. කජු කන්නා සේ - ඉතා පහසුවෙන්
9. හමස් පෙට්ටියට යැම - ක්‍රියාත්මක නොවී තිබීම
10. කැලෑ නීතිය - බලවතා දුබලයා පෙළීම
11. හුඹස් බිය - අස්ථාන බිය
12. මර ඇඳේ - අන්තිම අවස්ථාවේ
13. අඟින් කිරි දෙවීම - නිෂ්ඵල කාර්යයක් කිරීම
14. පට් කැඩුණා - ගෞරවය කෙලෙසුණා
15. උඩුකුරිකද්කදං වෙලා - විස්මයෙන් යුතුව බැලූ අයුරු
16. ත්‍රිපිටකය වනනවා - ධර්මයට අනුව සම්ප්‍රදායානුකූල අදහස් සහිතව ජීවත් වන බව
17. ඇස් අන්ධ වෙලා - යථාර්ථය යටපත්ව ඇති බව
18. දිනන පිළට කොඩිය දීම - දිනන පක්ෂය බලා එයට එකතු වීම
19. ඇඟිලි ගනිමින් - ඉමහත් බලාපොරොත්තුවෙන්
20. පොත් ගුල්ලෙකි. - ඕනෑ ම පොතක ඇති දෙයක් මතකයෙන් කීමට දනී.
21. අත දෙනවා - උදවු කරනවා
22. හෙනහුරා ලබලා නරක කාලයක් උදා වෙලා
23. ලෑල්ලට පැගුවා - ඉතා වේගයෙන් ගියා
24. සායම ගියා - ලැජ්ජාවට පත් වුණා
25. ගොළුබෙලි ගමන - හෙමින් වැඩ කිරීම
26. දෙහි කපනවා - දොස් පවරනවා
27. කටු අත්තක් - නිතර දබර කරන අයෙක්
28. කොළේ වහනවා - යම් කරුණක් සඟවනවා
29. ඇඟ බේරා ගත්තා - උපායශීලීව මග හරිනවා
30. එක පයින් - සම්පූර්ණ කැමැත්තෙන්
31. මර ඇඳේ දි - අන්තිම අවස්ථාවේ
32. අකුල් හෙළනවා - බාධා කරනවා

1. පහත දැක්වෙන රුඩීවලින් පළ වන අර්ථය ඉදිරියෙන් ලියන්න.

1. ඇගේ ලේ වතුර වුණා - ..............................................................
2. ඉබාගාතෙ යනවා - ..............................................................
3. අබ මල් රේණුවක් වත් - ..............................................................
4. අගේ ඉඳන් කන කනවා - ..............................................................
5. එක පනේ කෑ - ..............................................................
6. ඉහ තිකට බලා - ..............................................................
7. මුළු සේසත ම - ..............................................................
8. දිවෙන් දිව ගා ගෙන - ..............................................................
9. අං ඇවිල්ලා - ..............................................................
10. දඩමීමා කර ගත් - ..............................................................

3. i කොටසේ ඇති රුඩීවලට ගැළපෙන අර්ථය සහිත කොටස ii තීරුවෙන් තෝරා ලියන්න.

| i කොටස | ii කොටස |
|---|---|
| 1. කඹ අදිනවා | ක්‍රියාත්මක නො කිරීම |
| 2. හමස් පෙට්ටියට දමනවා | රහසින් අනුබල දීම |
| 3. සුදුහුණු ගානවා | රැකියාව අහිමි කිරීම |
| 4. බඩට ගහනවා | එකඟතාවක් නැතිකම |
| 5. උල්පන්දන් දෙනවා | ඇත්ත වසන් කරනවා |

4. මුලින් දී ඇති රුඩීයේ අර්ථයට සමාන තවත් රුඩීයක් වරහන තුළින් තෝරා ලියන්න.

1. සායම ගියා - ..............................................................
2. දිවෙන් දිව ගාගෙන - ..............................................................
3. අන්තිම ඉත්තත් ඇද්දා - ..............................................................
4. තරු විසිවුණා - ..............................................................
5. හැටට හැටේ - ..............................................................

(අවසාන තුරුම්පුවත් ගැහුවා, මූණ ඇඹුල් වුණා, පණට පණ, ලෑල්ලට පාගලා, එලොව පොල් පෙනුණා)

5. දී ඇති රුඩී යොදා අර්ථවත් වාක්‍යය බැගින් තනන්න.

උදාහරණ: විදේශගතව සිට පැමිණි, නිමල් දැන් ජීවත් වන්නේ **රජගෙදර පරෙවියා** මෙනි.

1. ගිනි ගෙඩියක් - ..............................................................
..............................................................
2. අතමාරුවක් - ..............................................................
..............................................................
3. සේසත ම - ..............................................................
..............................................................
4. අලගු තියන්නවත් බැරි - ..............................................................
..............................................................
5. ඉහේ මලක් පිපුණා - ..............................................................
..............................................................

# <u>රූඪී හෙවත් ඉගි වැකි පසුගිය විභාග ප්‍රශ්න</u>

**2019 O/L**

1. ඔවුන් දෙදෙනා වැඩ කළේ **දිවෙන් දිව ගා ගෙන** ය.
   (1) ඥාතීන් ලෙසින් ය.
   (2) හැම විට ම එක තැන සිට ය.
   (3) ඉතා මිත්‍රශීලී ව ය.
   (4) දිව එකිනෙක ස්පර්ශ කරමින් ය.

2. පාලකයන් සමග කටයුතු කළ යුත්තේ **දැලි පිහියෙන් කිරි කන්නා සේ** ය.
   (1) ඉතා පරෙස්සමිනි.
   (2) කැපෙනවාට බියෙනි.
   (3) දුරින් සිටිමිනි.
   (4) ඇඟෑලුම්කම් පාමිනි.

3. අක්කාගේ විවාහය ප්‍රමාද වූයේ අම්මා **වංශ කබල් ගෑ නිසා** ය.
   (1) තම පරම්පරාව ගැන කියූ නිසා
   (2) තමා ගැන පුරසාරම් කියූ නිසා
   (3) මනාල පාර්ශ්වයේ අඩුපාඩු කියූ නිසා
   (4) තම පරම්පරාව ගැන පුරසාරම් කියූ නිසා

---

**2018 O/L**

1. ඔහු අදහස් ප්‍රකාශ කළේ **උගුරට හොරා බෙහෙත් කන්නා සේ** ය.
   (1) කිසිවකුට නොදැනෙන්නාක් මෙන්
   (2) උගුරට නොදැනෙන පරිදි බෙහෙත් ගිලින්නාක් සේ
   (3) අනුන්ගේ බලකිරීම ඉටු කරන්නාක් මෙන්
   (4) යමක් වසන් කරන්නාක් මෙන්

2. **අල්ලේ පැළවෙන බොරු** කීමෙන් සමහරු තම කීර්තිනාමය නැති කර ගනිති.
   (1) කෙනකු රවටන බොරු බස්
   (2) කෙසේ වත් විශ්වාස කළ නොහැකි දේ
   (3) ඇදහීමට තරමක් දුෂ්කර කරුණු
   (4) අල්ල මත පැළවෙන දේ

3. කියන දෙයක් **වගෙන් ඔරෝ** නො කියා කෙළින් කියන්න.
   (1) ඍජු ආකාරයෙන්
   (2) ඔහෙන් වරෝ යන ලෙසින්
   (3) ව්‍යංගයෙන්
   (4) කෙනකුට නොදැනෙන අයුරින්

---

**2017 O/L**

1. අයියා **ඇඟිලි ගනිමින් සිටින්නේ** රැකියාවක් ලැබෙන තුරු ය.
   (1) නිකම් බලා සිටින්නේ
   (2) මහත් බලාපොරොත්තුවෙන් සිටින්නේ
   (3) දින සති ගෙවමින් සිටින්නේ
   (4) නිවසට වී කල් යවන්නේ

2. වරදක් සිදු කර **හොරෙන් වගහ එක** යහපත් දෙයක් නොවේ.
   (1) සඟවාගෙන සිටීම
   (2) ආපසු හැරී සිටීම
   (3) බොරු ප්‍රචාරය කිරීම
   (4) නොපිළිගෙන සිටීම

3. නංගී **ගසාගනියෙන්** ම ආවේ අම්මාට යමක් කීමට ය.
   (1) බියේ ගැහෙමින්
   (2) සිනාසෙමින්
   (3) කෑගසමින්
   (4) ඉක්මනින්

---

**2016 O/L**

1. නැඟී සිටින්නට වෙර දරන අයට **අත දීම** හොඳ පුරුද්දකි.
   (1) ප්‍රශංසා කිරීම
   (2) උදවු කිරීම
   (3) මිල මුදල් දීම
   (4) අගය කිරීමට ලක් කිරීම

2. ගුරුවරු දරුවන් වෙත **ඇස ගහගෙන** බලා සිටිති.
   (1) සෝදිසියෙන් යුතුව
   (2) කරබාගෙන
   (3) අනුකම්පාවෙන්
   (4) ඇස් දල්වාගෙන

3. ප්‍රධානියාගේ **මුනිවත රැකීම** සේවකයන්ට ප්‍රහේලිකාවක් විය.
   (1) ආගම සිහි කිරීම
   (2) ඇස් පියාගෙන සිටීම
   (3) නිශ්ශබ්දව සිටීම
   (4) කලබලකාරී වීම

## ප්‍රස්තාව පිරුළු

- යම් අවස්ථාවට උචිත අයුරින් යොදන කියමන" යන අරුතින් **ප්‍රස්තාව පිරුළු** නම් වේ. සිංහල ශබ්දකෝෂය පිරුළු හඳුන්වන්නේ 'තැනට ගැලපෙන කියමනකි, ආදර්ශවත් කීමකි, ආප්තෝපදේශයකි. යනුවෙනි.
- භාෂාවක සජීව බව, ඕජෝ ගුණය පල කෙරෙන මෙවැනි සාම්ප්‍රදායික යෙදුම් ප්‍රස්තාව පිරුළු නම් වෙයි. ප්‍රස්තාව පිරුළු යන්නෙහි ණයට ඉල්ලා ගත් දේ යන අරුත් ගැබ් වෙයි. ඒ අනුව අතීතයේ විසූ අපේ පැරැන්නන්ගෙන් ණයට ගත් මේ භාෂාත්මක ව්‍යවහාර සමාජයේ විවිධ අවස්ථාවල දී භාවිතයට ගැනේ.
- කතාවේ දී හා ලේඛනයේ දී අදහසක් වඩාත් රසවත්ව අර්ථවත්ව පල කිරීම සඳහා ප්‍රස්තාව පිරුළු උදවු වේ.
- ප්‍රස්තාව පිරුළු බොහෝ විට ඓතිහාසික සිදුවීමක්, ජනකතාවක්, පුරාවෘත්තයක්, පුද්ගල චරිතයක් හෝ සමාජ සංසිද්ධියක්, සතුන්ගේ චර්යාවක් හෝ පරිසරය නිරීක්ෂණයෙන් දැක්වෙන දෙයක් ඇසුරෙන් උපන් කියමනකි.

## 10, 11 ශ්‍රේණිවල සියලුම ප්‍රස්තාව පිරුළු

1. වඳින්න ගිය දේවාලේ හිස මත කඩා වැටුණා වගේ
   පිහිටක් පතා ගිය තැනින් විපතක් සිදු වීම
2. උපන් ගෙයි සිරිත බලි ඇරියත් යන්නෙ නැති ලු
   ජන්මයෙන් ආ දුර්ගුණ ඉවතලිය නො හැකි බව
3. දිකිරට බලල්ලුත් සාක්කි ලු
   වාසි පැත්තට කවුරුත් හිතවත්ව කතා කිරීම
4. කැලේට පායපු හඳ වගේ
   අගයක් නොමැති වීම
5. එපා වාහෙට හොදි බෙදන්නා වගේ
   පිළිකුලෙන් හෝ නො සැලකිල්ලෙන් සැලකීම
6. උඩින් මිතුරු යටින් හතුරු
   බොරුවට මිතුරුකම් පෙන්වමින් රහසින් හතුරුකම් කිරීම
7. අතු කඩා මොර කන්නා සේ
   අය මාර්ග මුළුමනින් ම විනාශ කර දැමීම
8. ඌරෝ කවද ද කහ කැවේ?
   අධමයන්ට උතුම් දෙයක් පලක් නැතිකම
9. කළුවා මාරපන් ගියා වගේ
   අරමුණකින් තොරව වැඩ කිරීම
10. පුංචි අම්මාත් ඇවිත් කැවුම් පුංචි කලා වගේ
    විශාල බලාපොරොත්තුවක් ඇතිව සිටිය ද ප්‍රතිඵලය අල්ප වීම.
11. කලක දි වහලූ කලක දි රස වෙනවා ලූ
    කලක් සතුරුව සිටි අය පවා පසුව මිතුරන් වන බව
12. අලි මදිවට හරක්
    එක් කරදරයක් පිට තවත් කරදරයක් ඒම
13. බොත්තම එබුවම ඔක්කොම කෙරෙනව වගේ.
    විද්‍යාත්මක, තාක්ෂණික වශයෙන් ලෝකය දියුණු වුවත් මිනිසාට විවේකය අඩු වී ඇති බව
14. වලිගෙ ගිනි ගත්තු හනුමලා වගේ
    දැඩි ආර්ථික සටනක යෙදෙන්නට මිනිසාට සිදු වී ඇති අයුරු
15. දොඩං ගොඩ බදා ගත්ත වගේ
    කෙතෙක් වෙහෙස වුව ද අවසානයේ කිසිදු ප්‍රතිඵලයක් අත් නොවුණ බව
16. අන්දරේ සීනි කැව වගේ
    උපක්‍රමශීලීව තම අදහස ඉටුකර ගැනීම
17. අබරා සිල් ගත්ත වගේ
    අනවබෝධයෙන් යමක් කිරීම
18. පරංගියා කෝට්ටේ ගියා වගේ
    කෙටි මගකින් යා හැකි ව තිබිය දී දුර මගකින් යාම

19.කලුවා මාරපන් ගියා වගේ
අරමුණකින් තොරව වැඩක් කිරීමේ නිෂ්ඵල බව

20.ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලුව වගේ
ලබා ගත නො හැකි දෙයක් වෙනුවෙන් මෙහෙයවීම

21.අත දීල දත තියවනව වගේ
උදව්වක් කර යමක් බලාපොරොත්තු වීම

22.වක්කඩේ හකුරු හැංගුව වගේ
සුදුසු රැකවරණයක් නැති වීම

23.ගුරුන්ටත් අකුරු වරදිනවලු
කා අතිනුත් වැරදි සිදු වන බව

24.එළිපත්ත උඩ ඉන්න බළල වගේ
ස්ථිර තීරණයක් නැති බව

25.ඔංචිල්ලාව එහාට ගියත් මෙහාට එනවලු
ඕනෑ ම ක්‍රියාවකට යම් ප්‍රතික්‍රියාවක් ද ඇති බව

1. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවලින් පළ වන අර්ථය ලියන්න.

1. නරියාට කුකුල් කොටුව බාර දුන්නා වගේ

.......................................................................................................................

2. කබලෙන් ළිපට වැටුණා වගේ

.......................................................................................................................

3. උණහපුළුවට උගේ පැටියා මැණිකලු

.......................................................................................................................

4. දියකාවගෙ පිටේ ලුණු හැංගුවා වගේ

.......................................................................................................................

5. ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ

.......................................................................................................................

2. පහත දී ඇති ප්‍රස්තාව පිරුළු යොදා වාක්‍ය තනන්න.

1. ආඩි හත් දෙනාගෙ කැඳ හැළිය වගේ

.......................................................................................................................

.......................................................................................................................

2. හිසරදේට කොට්ටෙ මාරු කරන්නා සේ

.......................................................................................................................

.......................................................................................................................

3. වැල යන අතට මැස්ස ගහන්නා සේ

.......................................................................................................................

.......................................................................................................................

4. එළ හරකයි මී හරකයි එකට ඇඳුවා වගේ

.......................................................................................................................

.......................................................................................................................

5. බැඳගත්ත බෙරේ ගහන්න ඕනෑ

.......................................................................................................................

.......................................................................................................................

**3.** i කොටසේ ඇති ප්‍රස්තාව පිරුළට වඩාත් ගැළපෙන යෙදුම ii කොටසින් තෝරා ලියන්න.

i කොටස

1. හිඟන්නාගේ පාත්තරේ හෙනහුරා වැටුණා වගේ

.....................................................................................................................

2. අහසට ඉණිමං බඳිනවා වගේ

.....................................................................................................................

3. ලූලා නැති වළට කණයා පණ්ඩිතයා

.....................................................................................................................

4. නියර මිටි තැනින් වතුර බහිනව වගේ

.....................................................................................................................

5. ගඟෙන් වතුර බී මුහුදට ආවැඩීම

.....................................................................................................................

ii කොටස

1. ප්‍රධානියා නැති විට අවශේෂ පුද්ගලයන් ප්‍රධාන වන බව
2. වැරැද්දේ වගකීම දුබලයාට පැවරීම
3. කරදරයට පත් වී සිටින විට තවත් කරදරයක් වීම
4. උපකාර කළ පුද්ගලයා අමතක කර බලවතුන් වර්ණනා කිරීම
5. නිෂ්ඵල ක්‍රියාවක් කරන බව

4. හිස්තැනට යෝග්‍ය පරිදි ගැළපෙන යෙදුම් යොදා පිරුළු සම්පූර්ණ කරන්න.

1. යන යකා ...................................... බිඳ ගෙන යනවලු
2. දී කිරට ...................................... සාක්කිලු
3. උණු හින්ද බොන්නත් බෑ .................................. අහක දාන්නත් බෑ
4. බල්ලන්ට .......................................දුන්න වගේ
5. ................................. ඇත්නම් කොහොම බඳින්න බැරි ද

**3**. පහත සඳහන් කියුම්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළු ලියන්න.

1. සැනසිලි පතා කරන දෙයින් පෙර තිබුණාටත් වඩා කරදර පැමිණීම.

.....................................................................................................................

2. තමා වැරදි කරමින් අනුන්ට දැනමුතුකම් දීම

.....................................................................................................................

3. නරක ඇසුර තිබුණත් යහපත් පුද්ගලයා අයහපත් අයකු බවට පත් නො වේ.

.....................................................................................................................

4. යමකුගේ සැබෑ තත්ත්වය පෙනෙන්නේ ඔහුගේ ක්‍රියා කලාපයෙනි.

.....................................................................................................................

5. ජන්මයෙන් ලද දුර්ගුණ ඉවත ලිය නො හැකි ය.

.....................................................................................................................

**ප්‍රායෝගික අභ්‍යාස**

1. පහත දී ඇති පිරුළුවල උත්පත්ති කතා සොයා ලියන්න.
(කලුවා මාරපන් ගියා වගේ, රාලහාමි බතල කන්න පොල් තේරුවා වගේ, අන්දරේ සීනි කෑවා වගේ)
2. ප්‍රස්තාව පිරුළු, රූඪි එහි අර්ථ සහිතව ද, එක් එක් වර්ගයට අයත් යුගල පද ද එක් කර බස සරසන සාම්ප්‍රදායික යෙදුම් මැයෙන් පොත් පිංචක් සකස් කරන්න.

<u>**ප්‍රස්තාව පිරුළු පසුගිය විභාග ප්‍රශ්න**</u>

**26.** 'නිෂ්ඵල ක්‍රියාවක නිරත වීම'

(1) අබරා සිල් ගත්තා වාගේ
(2) පරංගියා කෝට්ටෙට ගියා වාගේ
(3) අටුව කඩා පුටුව හදන්නා වාගේ
(4) අන්දරේ සීනි කෑව වාගේ

**27.** 'වඩාත් උඩඟු වී ක්‍රියා කිරීම'

(1) පාළු ගෙයි වළං බිඳිනවා වාගේ
(2) අශ්වයාට අං ලැබුණා වාගේ
(3) අගේ ඉඳන් කන කනවා වාගේ
(4) නැගපු ඉණිමගට පයින් ගහනව වාගේ

2019 O/L

---

**26.** වඳින්න ගිය දේවාලෙ හිස මත කඩා වැටුණා වාගේ

(1) දේවාලය දිරා ගොස් තිබූ නිසා හිස මත කඩා වැටීම
(2) යම් පිහිටක් බලාපොරොත්තුවෙන් ගිය විට එය ඉටු නොවීම
(3) එක් කරදරයක් අතරතුර තවත් කරදරයකට මුහුණ දීම
(4) පිහිටක් බලාපොරොත්තුවෙන් ගිය විට තවත් විපතකට මුහුණ පෑම

**27.** ඉබ්බන්ගෙන් පිහාටු ගන්නවා වාගේ

(1) ලබා ගත නොහැකි දෙයකට බලාපොරොත්තු තැබීම
(2) ඉතා අමාරුවෙන් යමක් ලබා ගැනීම
(3) නැති දෙයක් කෙසේ හෝ ලබා ගැනීම
(4) සඟවාගෙන තිබෙන දෙයක් ඉල්ලා ගැනීම

2018 O/L

---

**26.** කිසිම ආකාරයකින් නිදහසක් නොමැති වීම

(1) ඉස රැදාවට කොට්ටෙට මාරු කළා වගේ
(2) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ
(3) හිරයට අහු වුණු පූවක් ගෙඩිය වගේ
(4) කම්මලේ ඉන්න බල්ලා වගේ

**27.** තමන් කළ වැරැද්ද තමන්ට ම දැනීම

(1) අබ කෑ මිනිහාගේ තහය දනවා වගේ
(2) අනුන්ට කැපූ වළේ තමන් වැටුණා වගේ
(3) හිල් කුඩෙන් වතුර අදිනවා වගේ
(4) අටුවෙන් දුමට පැන්නා වගේ

2017 O/L

---

**26.** එක් කරදරයක් පිට තවත් කරදරයක් පැමිණීම

(1) අලි මදිවට හරක්
(2) දී කිරට බළල්ලුත් සාක්කි
(3) අනුන්ට කැපූ වලේ තමනුත් වැටේ
(4) උඩ පැන්නොත් බිම වැටේ

**27.** තමන් නොකරන කාර්යය අනුන්ට ද කිරීමට නොදීම

(1) සෙක්කුවේ බැන්ද හරකා වගේ
(2) පිදුරු ගොඩේ ඉන්න බල්ලා වගේ
(3) අතු කඩා මොර කන්නා වගේ
(4) පාරුකාරයාගේ උම්බලකඩේ වගේ

2016 O/L

## <u>යුගල පද</u>

- පද දෙකක් හෙවත් පද යුගලයක් එකට යෙදීම යුගල පද නම් වේ.
- ඇතැම් යුගල පදවල පද යුගල අර්ථයෙන් සමාන වේ.

| | | |
|---|---|---|
| වාද භේද | ගරු නම්බු | හුරු පුරුදු |
| මිල මුදල් | සමිති සමාගම් | නැණ නුවණ |
| වැහි වරුසා | දුගී දුප්පත් | පදවි තානාන්තර |
| බණ දහම් | වෙහෙර විහාර | ශිල්ප සාස්තරේ |
| යාන වාහන | කෙළි සෙල්ලම් | රැකී රක්ෂා |

- ඇතැම් යුගල පදවල පද යුගල අර්ථයෙන් සමාන නොවේ. (විරුද්ධාර්ථ පද)

| | | |
|---|---|---|
| යන එන | කන කර | බාල මහලු |
| දුක සැප | උගත් නුගත් | ගුණ දොස් |
| හොඳ නරක | ඇති නැති | එදා මෙදා |
| ඈත මෑත | බාල මහලු | එතෙර මෙතෙර |
| පින් පව් | අඩු වැඩි | අග මුල |

- ඇතැම් යුගල පදවල එක් පදයක අර්ථය පැහැදිලි නැත. නමුත් එය අනෙක් පදයේ අර්ථය තීව්‍ර කිරීමට ඉවහල් වේ.

| | | |
|---|---|---|
| ඉඩම් කඩම් | අස් පස් | අග හිග |
| බඩු මුට්ටු | මුදල් හදල් | උදව් පදව් |
| කුලී මලී | පඩි නඩි | තරහ මරහ |
| ගමන් බිමන් | බාර හාර | ඉඩම් කඩම් |
| ළමයි බමයි | කුල මල | තොවිල් පවිල් |

- ඇතැම් යුගල පදවල පදයුගලේම අර්ථය පැහැදිලි නැත.

| | | |
|---|---|---|
| ලට පට | තක්කු මුක්කු | දනි පනි |
| ජර මර | ඕප දූප | තොර තෝංචි |
| ආත පාත | අතං මතං | අඩුම කුඩුම |
| වං හුං | ලවක් දෙවක් | ලට්ට ලොට්ට |

- ඇතැම් යුගල පදවල පදයුගල අර්ථයෙන් සමීප වේ.

| | | |
|---|---|---|
| ඇට කටු | පොත පත | ළඟ පාත |
| වතු පිටි | හැලි වලං | කයි කතන්දර |
| ගේ දොර | නිති රීති | කොට්ට මෙට්ට |
| දුගී මගී | ලියුම් කියුම් | හොර බොරු |

- ඇතැම් යුගල පදවල පදයුගල එකිනෙකට අසමාන පූර්ව ක්‍රියා පද යුගලක් වේ.

| | | |
|---|---|---|
| සිනා බලා | ලියා කියා | නටා ගයා |
| දුව පැන | හදා වඩා | උයා පියා |
| බලා කියා | කර කියා | ගයා වයා |
| කවා පොවා | තලා පෙලා | සොයා බලා |

- තවත් විවිධ නිර්ණායක පදනම් කරගෙන යුගල පද වර්ගීකරණය කළ හැකි ය. මේවා ලේඛනයක සාරවත් භාවය වර්ධනයට ඉවහල් වන සාම්ප්‍රදායික යෙදුම් විශේෂයකි.

1. පහත දැක්වෙන යුගල පද සම්පූර්ණ කරන්න.

| | | | |
|---|---|---|---|
| **1.** තෑගි | - ............................. | **2.** තුටු | - ............................. |
| **3.** අවි | - ............................. | **4.** අරුම | - ............................. |
| **5.** උදවු | - ............................. | **6.** ගනු | - ............................. |
| **7.** ඉඳුම් | - ............................. | **8.** ඉහින් | - ............................. |
| **9.** ලේසි | - ............................. | **9.** ගමේ | - ............................. |

**2.** පළමුව දක්වා ඇති යුගල පදයේ අර්ථයට සමීප යුගල පදය ඉදිරියේ ඇති යුගල පදවලින් තෝරා යා කරන්න.

| | |
|---|---|
| 1. අහල පහල | සල්ලි බාගෙ |
| **2.** මුදල් හදල් | පඩුරු පාක්කුඩම් |
| **3.** ලිපි ලේඛන | ළඟ පාත |
| **4.** තෑගි බෝග | චාරිත්‍ර වාරිත්‍ර |
| **5.** සිරිත් විරිත් | ලියුම් කියුම් |

**3.** එක් එක් යුගල පද අයත් වන වර්ගය ඉදිරියෙන් තෝරා ලියන්න. එම යුගල පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

උදාහරණ: සමිති - සමාගම් = සමානාර්ථ

ඔහු සමිති සමාගම් රැසක නිල තල හෙබවී ය.

**1.** මං මාවත් - ..........................................................................................

..........................................................................................................

**2.** දැන උගත් - ..........................................................................................

..........................................................................................................

**3.** තක්කු මුක්කු - ......................................................................................

..........................................................................................................

4. සද්ද බද්ද - ................................................................................................................................

................................................................................................................................................

5. ඇති නැති - ................................................................................................................................

................................................................................................................................................

6. මැහුම් ගෙතුම් - ........................................................................................................................

................................................................................................................................................

7. බෙත් හේත් - ..............................................................................................................................

................................................................................................................................................

8. පින් පව් - ..................................................................................................................................

................................................................................................................................................

9. වං හුං - ......................................................................................................................................

................................................................................................................................................

10. කර කියා - ..................................................................................................................................

................................................................................................................................................

<u>රූඪී හෙවත් ඉඟි වැකි පසුගිය විභාග ප්‍රශ්න - පිළිතුරු</u>

2019 o/L 01. 03
2019 o/L 02. 01
2019 o/L 03. 04
2018 o/L 01. 04
2018 o/L 02. 02
2018 o/L 03. 03
2017 o/L 01. 02
2017 o/L 02. 01
2017 o/L 03. 04
2016 o/L 01. 02
2016 o/L 02. 01
2016 o/L 03. 03

<u>ප්‍රස්තාව පිරුළු පසුගිය විභාග ප්‍රශ්න - පිළිතුරු</u>

2019 o/L 26. 03
2019 o/L 27. 02
2018 o/L 26. 04
2018 o/L 27. 01
2017 o/L 26. 03
2017 o/L 27. 01
2016 o/L 26. 01
2016 o/L 27. 02

1. පහත දැක්වෙන රුඪිවලින් පළ වන අර්ථය ඉදිරියෙන් ලියන්න.

i. ඇගේ ලේ වතුර වුණා - දැඩි ලෙස බිය වීම.
ii. ඉබාගාතෙ යනවා - අරමුණකින් තොරව යාම.
iii. අබ මල් රේණුවක් වත් - කිසිම ආකාරයකින් විශ්වාස කළ නොහැකි.
iv. අගේ ඉඳන් කන කනවා - කෙනෙකුන් සමීපයේ සිට ඔහුට එරෙහිව වැඩ කිරීම.
v. එක පතේ කෑ - ඉතා සුහදව ආශ්‍රය කළ.
vi. ඉහ නිකට බලා - තරාතිරම, තත්වය, වයස ආදිය සිතා කටයුතු කිරීම.
vii. මුළු සේසත ම - සියලු වත්කම්.
viii. දිවෙන් දිව ගා ගෙන - දැඩි මිත්‍රත්වයක් පවත්වා ගනිමින්.
ix. අං ඇවිල්ලා - මහත් සේ අහංකාරව කටයුතු කිරීම.
x. දඩමීමා කර ගත් - යමක් හෝ යමෙකු මුල් කරගෙන ඉන් වාසි ලැබීමට කටයුතු කිරීම.

2. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවලින් පළ වන අර්ථය ලියන්න.

i. නරියාට කුකුල් කොටුව බාර දුන්නා වගේ
ii. කබලෙන් ළිපට වැටුණා වගේ
iii. උණහපුළුවට උගේ පැටියා මැණිකලු
iv. දියකාවගෙ පිටේ ලුණු හැංගුවා වගේ
v. ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ

01. විශ්වාසය තැබිය නොහැකි කෙනෙකුට කිසියම් වැඩක් භාර දීම.
02. තිබුණාටත් වඩා අසීරු තත්වයකට පත්වීම.
03. කාට වුවත් තමන් සතු දේ අගේ ඇති බව.
04. කිසිම ආරක්ෂාවක් නොමැති ලෙස යමක් කිරීම.
05. විපතක් වූ කෙනෙකුට තවත් විපතක් සිදු වීම.

3. පහත දී ඇති ප්‍රස්තාව පිරුළු යොදා වාක්‍ය තනන්න.

i. ආඬි හත් දෙනාගෙ කැඳ හැළිය වගේ
ii. හිසරදේට කොට්ටෙ මාරු කරන්නා සේ
iii. වැල යන අතට මැස්ස ගහන්නා සේ
iv. එළ හරකයි මී හරකයි එකට ඇඳුවා වගේ
v. බැඳගත්ත බෙරේ ගහන්න ඕනෑ

01. විනෝද චාරිකාවක් යාමට මුදල් එක් රැස් කිරීමට ඔවුන් කතිකා කර ගත්තත් එය අවසානයේ ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ විය.
02. හිසරදේට කොට්ටෙ මාරු කරන්නා සේ ඔහු වරින් වර තම සේවා ස්ථානය මාරු කළේය.
03. වැල යන අතට මැස්ස ගහන්නා සේ ඔහු තම ප්‍රතිපත්ති කාලානුරූපීයව වෙනස් කළේය.
04. පියදාසත් සිරිසේනත් එකතු වී කුඹුර අස්වැද්දීමට යනු දුටු ගම්හු, එළ හරකයි මී හරකයි එකට ඇඳුවා වගේ යැයි කීහ.
05. බිරියගේ ඇනුම් පද ඇසූ හෙතෙම දැන් ඉතින් බැඳගත්ත බෙරේ ගහන්න ඕනෑ යැයි තම මිතුරාට පැවසුවේය.